### අධ්‍යාපන අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

# නීති නිලධාරී තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

1979 අංක 53 දරන පනත යටතේ ස්ථාපිත ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම ජාතියේ නවෝත්පාදන හැකියාවන් ප්‍රවර්ධනය කිරීමේ ප්‍රධාන වගකීම් දරන ආයතනය වේ. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කොමිසම වර්තමානයේ කොමසාරිස්වරයෙකු සහ සහකාර කොමසාරිස්වරුන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ.

කොමිසමේ පුරප්පාඩුව පවතින නීති නිලධාරී තනතුර සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## නීති නිලධාරී (තනතුරු 01)

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද -**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් නීති උපාධියක් ලබා තිබීම (LL.B) සහ ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් අදාළ වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

**තනතුරට පැවරෙන කාර්යයන් -**

නව නිපැයුම් වාණිජකරණ ක්‍රියාවලියේදී හා බුද්ධිමය දේපළ සම්බන්ධ කාර්යයන් වලදී අවශ්‍ය නීති ආධාර ලබා දීම, නව නිපැයුම්කරුවන්ගේ නීතිමය අවශ්‍යතා, ගැටළු සහ සමස්ත ආයතනික නීතිමය අවශ්‍යතා සපුරාලීම.

**වැටුප් පරිමාණය -**

MM 1 - 2 - 2016 - රු. 54,550 - 10 X 1,375 - 15 X 1,910 - රු. 96,950.00

**අමතර ප්‍රතිලාභ -**

සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට පිළිවෙලින් 15% හා 3% දායකත්වයක් ලබා දේ.

**වයස් සීමාව -**

අවුරුදු 22 - 45 ත් අතර විය යුතු වේ.

**සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු දීමේ ක්‍රමය** : අදාළ අතිරේක අධ්‍යාපන සුදුසුකම්, අදාළ පළපුරුද්ද, වෘත්තීය ප්‍රවීණතා/ වෙනත් සුදුසුකම් සහ සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව මත රඳා පවතී.

තමන් විසින් සකස් කර ගන්නා ලද ජීව දත්ත තොරතුරු සහිත ඉල්ලුම්පත් 2024.01.23 වන දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත්‍රය සමග සියලුම සහතික වල පිටපත් ඉදිරිපත් කළ යුතු අතර, අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුයි. රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා හෝ ව්‍යවස්ථාපිත ආයතන වල අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් මගින් සිය අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.


**කොමසාරිස්**
**ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම**
**05 වන මහල,**
**"මෙහෙවර පියෙස" ගොඩනැගිල්ල,**
**කොළඹ 05.**
**www.slic.gov.lk**
**011-2676645**